# ගුරු සේවයේ නිරත ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරු වෘත්තිකයින්ගේ පංති කාමර ඉගැන්වීමේ සාර්ථකත්වය පිළිබඳව කෙරෙන අධ්‍යයනයක්.

ජී. පී. මාතර ආරච්චි

B.A, M.A, P.G.D.E., M.Ed.,

2000/M.Phil/07

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණාත්මක නිබන්ධනය

UCLIB

539323

University of Colombo Library Sri Lanka

අධ්‍යාපන පීඨය.

කොළඹ විශ්ව විද්‍යාලය,

කොළඹ 03.

# සාරාංශය

ගුරු සේවයේ නිරත ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරු වෘත්තිකයින්ගේ පංතිකාමර ඉගැවීමේ සාර්ථකත්වය පිළිබඳව මෙම අධ්‍යයනය කරන ලදී.

පිළිගත් ක්‍රමවේදයක් නොපැවැතියෙන් අතීතයේදී විවිධ සුදුසුකම් තිබූ අය ගුරු වෘත්තිය සඳහා බඳවා ගනු ලැබිණි. මෑතදී හඳුන්වා දෙන ලද ප්‍රතිපත්තිය අනුව වැදගත් හා කැපී පෙනෙන ප්‍රවේශ සුදුසුකමක් ලෙස ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ තුළින් පිරිනමනු ලබන ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලා සහතිකය පිළිගනු ලැබිණි. ශ්‍රී ලංකාවේ රජයේ පාසල් සඳහා ගුරුවරුන් බඳවා ගැනීමේ නිශ්චිත ප්‍රතිපත්තියක් තිබූ බවක් නොපෙනුනත් 1997 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා තුළ ගුරුවරුන් බඳවා ගැනීම පිළිබඳ ප්‍රතිපත්තියක් ඉදිරිපත් කර තිබුණි. එයට අනුව ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වලට, ප්‍රාථමික ගුරුවරුන් පුහුණු කරන විධිමත් ආයතනය වශයෙන් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හඳුන්වා දෙන ලදී. ජාතික අධ්‍යාපන විද්‍යා පීඨවල ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය මේ සඳහා අවශ්‍ය වේ.

මෙම ප්‍රතිපත්තිමය තීරණය කිසිදු පර්යේෂණ තොරතුරක් මත පදනම් වූයේ නැත. මෙවැනි තීරණ ක්‍රියාත්මක කිරිමට නම් සැබවින්ම පාසල් පද්ධතිය තුළ සිටින ශික්ෂණ විදයා ඩිප්ලෝමාධාරී ගුරු වෘත්තිකයන් ගේ පංති කාමර ඉගැන්වීමේ සාර්ථකත්වය පිළිබඳ පවතින තත්ත්ව ඉතා හොඳින් තක්සේරුකළ යුතුය. ඒ නිසා ගුරු සේවයේ නිරත ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරු වෘත්තිකයින්ගේ පංතිකාමර ඉගැන්වීම විමසා බලා පවතින තත්ත්වය සැබෑ ලෙස අනාවරණයකරදීම, අධ්‍යාපන ප්‍රතිපත්ති තීරකයින්ට, ප්‍රතිපත්ති සම්පාදකයින්ට හා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පද්ධතිය තුළ සිටින පුහුණු කරුවන්ටද, එසේම පුහුණුලාභී ගුරුවරුන්ටද බෙහෙවින්ම ප්‍රයෝජනවත් වේ. එසේම මෙම ක්ෂේත්‍රය මෙතෙක් පර්යේෂකයින් විසින් ආවරණය කර නොතිබීමද මෙම අවශ්‍යතාව තවත් තීව්‍ර කරන්නට හේතු විය.

මෙම ගුරු ප්‍රජාවගේ පුහුණුව සඳහා ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සඳහා වෙන්වන මුදලින් විශාල ප්‍රතිශතයක් වැය වේ. මේ අය දෙවසරක

නේවාසික පුහුණුවක්ද වසරක සීමාවාසී පුහුණුවකින්ද අනතුරුව පුහුණු ගුරුවරයකු වශයෙන් ස්ථිර පත්වීම් ලබති. එම නිසා ඉහත සඳහන් ගුරුවරුන්ගේ වෘත්තීය සාර්ථකත්වයේ ස්වභාවය තක්සේරු කිරීමත් ඔවුන්ගේ පංතිකාමර ඉගෙනුම් ඉගැන්වීම්හි සාර්ථක අසාර්ථක භාවය පිළිබඳව සොයාබැලීමත් වැදගත්ය. මෙම අරමුණු ඉටුකර ගැනීම පිණිස විස්තරාත්මක පර්යේෂණ ක්‍රම පිළිවෙත අනුගමනය කරමින් සපරගමුව පළාතේ සිංහල මාධ්‍ය 1AB, 1C. 2 හා 3 වර්ගයේ පාසල්හි සේවයෙහි යෙදෙන ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී 100 ක් පමණ ගුරු ප්‍රජාවගේ පංතිකාමර ඉගැන්වීම ඇගයීමට ලක් කිරීමට මෙම අධ්‍යයනය සැලසුම් කරන ලදී. එම ඇගයීම පදනම් කොට ගෙන ඔවුන්ගේ ඉගැන්වීම පිළිබඳ මෙම අධ්‍යයනය මගින්, ඔවුන්ගේ ඉගැන්වීම දියුණු කිරීමට අදාළ නිගමන හා යෝජනා ඉදිරිපත් කර තිබේ.

මෙම පර්යේෂණ අධ්‍යයනය සඳහා පහත දැක්වෙන අරමුණු පදනම් කර ගන්නා ලදී.

1. ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සංවර්ධන ක්‍රියාවලියේ විවිධ පියවර ක්‍රියාවට නංවා ඇති ආකාරය විමර්ශනය කිරීම.
2. පුහුණුවෙන් පසුව කෙරෙන පංති කාමර ඉගැන්වීම් සීමාවාසී පුහුණු ප්‍රමිතීන්ට අනුව සිදුවේදැයි සොයා බැලීම.
3. සීමාවාසී පුහුණුවෙන් පසුව කෙරෙන පංති කාමර ඉගැන්වීම් සීමාවාසී කාලයේ පංතිකාමර ඉගැන්වීම් වලට කොතෙක් දුරට අනුකූල වේදැයි පරීක්ෂා කර බැලිම.
4. එම අනුකූලතාවය හෝ අපගමනීය තත්වයට හේතු කවරේදැයි හඳුනාගැනීම.
5. අපගමනීය තත්ත්වයක් ඇතොත් ඒවා මග හරවා ගැනීමටත් අනුකූලතාවක් වෙතොත් ඒවා තවදුරට පෝෂණය කිරීමටත් ගතයුතු ක්‍රියාමාර්ග කවරේදැයි සොයාබැලීම වේ.

මේ පර්යේෂණයේදී දත්ත එක්රැස් කර ගැනීම සඳහා යොදා ගන්නා ලද ක්‍රම ශිල්ප හා උපකරණ වශයෙන් දක්වන්නේ විමර්ශනය හා සම්මුඛ සාකච්ඡා යනාදියයි. එමෙන්ම එක් එක් පර්යේෂණ අරමුණු වෙනුවෙන්

University of Colombo Library Sri Lanka

දත්ත ලබා ගැනීමට එක් එක් ක්‍රම ශිල්ප භාවිත කරන ලදී. එහිදී අධ්‍යාපන විද්‍යාපීඨවල ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සංවර්ධනය කිරීමේ විවිධ පියවර විමර්ශනය කිරීම සඳහා දත්ත ප්‍රභව වශයෙන් ගුරු අධ්‍යාපනය පිළිබඳ ග්‍රන්ථ පරිශීලනය කරන ලද අතර ජාතික අධයාපන විද්‍යාපීඨ කථිකාචාර්යවරු, ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් හා අධ්‍යාපන අමාත්‍යාංශයේ පීඨ ශාඛා නිලධාරීන් යොදා ගෙන සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී.

දෙවැනි පර්යේෂණ අරමුණ වෙනුවෙන් දත්ත සපයා ගැනීමේ ප්‍රභව වූයේ සීමාවසී පුහුණු කාලයේ පුහුණු ප්‍රමිතීන් පෙන්වා දෙන ගුරු අධ්‍යාපනය සම්බන්ධ ග්‍රන්ථ හා නිගමනය. එයින් එම ග්‍රන්ථ විමර්ශනයෙන් පුහුණු ප්‍රමිති සපයා ගන්නා ලදී. ඉන් අනතුරුව පංති කාමර ඉගැන්වීමේ ස්වරූපය සොයා බැලීම සඳහා නිරීක්ෂණ නියමාවලී සහ අධීක්ෂණ පත්‍රිකා උපයෝගී කර ගනිමින් පංති කාමර අධීක්ෂණයෙන් එහි ස්වභාවය සම්බන්ධ දත්ත සපයා ගැණුනි.

ඊළඟ පියවරේදී තෙවන අරමුණ වූ සීමාවාසී කාලයේ පුහුණු ප්‍රමිතිවලට වර්තමාන පංතිකාමර ඉගැන්විම කොතෙක් දුරට අනුකූල වේදැයි සොයා බැලිණි. ඒ සඳහා ඉහත පළවූ අරමුණු සඳහා සපයා ගත් දත්ත හා දෙවන අරමුණ වෙනුවෙන් සපයා ගත් දත්ත සැසැඳීමෙන් හා පිළියෙල කරන ලද වට්ටෝරු යොදා ගනිමින් මෙම අනුකූලතාව විමසා බලන ලදී.

පර්යේෂණයේ 4 වන අරමුණ වූයේ මෙහි අපගමනීය තත්ත්වයට හෝ අනුකූලතාවයට හේතු කවරේදැයි සොයා බැලීමය. මේ සඳහා සාහිත්‍ය විමර්ශනයද සම්මුඛ සාකච්ඡා සිදු කිරීමෙන් ලත් දත්තද උපයෝගී කර ගන්නා ලදී. මෙහි අපගමනීය තත්ත්වයක් ඇතොත් ඒවා මග හරවා ගැනීම සඳහාත් අනුකූලතාවක් වෙතොත් ඒවා තවදුරටත් පෝෂණය කිරිමටත් ගතයුතු ක්‍රියාමාර්ග තර්කණය හා හේතු පාදනය වැනි උපාය මාර්ග උපයෝගී කර ගනිමින් යෝජනා ඉදිරිපත් කෙරේ.

පර්යේෂණය මෙහෙයවනු ලැබූ පළමුවන පියවර වූයේ සපරගමුව පළාතේ සිංහල මාධ්‍ය ප්‍රාථමික පාසල් හඳුනාගෙන ඒවායේ 1AB, 1C, 2,3 යන වර්ගීකරණයට අදාළ වන පරිදි ගුරුවරු 100 ක පමණ ප්‍රමාණයක් තෝරා

ගැනීමය. මෙම ගුරු නියැදිය තෝරා ගැනීමේදී ප්‍රාථමික පාඨමාලාව පැවැත්වෙන සියලු විද්‍යාපීඨ නියෝජනය වන පරිදි ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම විවාහක, අවිවාහක භේදයෙන් තොරව ගුරු පිරිස තෝරා ගැණුනි. මේ අයට නොදන්වා ඔවුන්ගේ පංති කාමර ඉගැන්වීම අධීක්ෂණය කරන ලදී. ඉන් අනතුරුව සම්මුඛ සාකච්ඡාවක්ද කරන ලදී. ඒ සමගම අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීන්. විද්‍යා පීඨ කථිකාචාර්යවරුන් හා ජාතික අධ්‍යාපන ආයතන නිලධාරීන් හමුවී විද්‍යාපීඨ ගුරු ප්‍රජාවගේ පාඨමාලා සංවර්ධනය වෙනුවෙන් ගනු ලැබූ පියවරවල් හා එහි ස්වභාවය සාකච්ඡා කරන ලදී. එමෙන්ම සාහිත්‍ය විමර්ශනය තුළින්ද මේ පිළිබඳ තොරතුරු සපයා ගැණුනි. ඉන් අනතුරුව පංති කාමර අධීක්ෂණයෙන්ද සම්මුඛ සාකච්ඡා තුළින්ද ලබාගත් දත්ත හා සසඳමින් විස්තරාත්මක සංඛ්‍යාන විධි භාවිත කරමින් විශ්ලේෂණය කරන ලදී. එහිදී සපයා ගත් තොරතුරු වූයේ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී ප්‍රාථමික ගුරු ප්‍රජාව සමස්ථයක් වශයෙන් ගත්විට බලාපොරොත්තු වන මට්ටමින් සිය වෘත්තිමය සාර්ථකත්වය කරා ළඟාවී නැති බවයි.

සමහරක් ගුරු භවතුන් පංති කාමර ඉගැන්වීම ඉතා සාර්ථකව ඵලදායී අයුරින් ක්‍රියාවට නන්වන බව පෙනී ගියේය. මෙහිදී ඒ ඒ විද්‍යාපීඨ වලින් ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව ලබාගත් අය අතර සාර්ථකත්වයේ හෝ අපගමනීය තත්ත්වයේ වෙනස්කම් දක්නට ලැබුණි. සේවා කාලය අනුව පංති කාමර ඉගැන්වීමේ වෙනස්කම් දක්නට ලැබුණි. එමෙන්ම විවාහක අවිවාහක බව, පාසල් හා පාසල් සංස්කෘතියේ ස්වභාවය, ඉගෙනුම ලබන ශිෂ්‍යයාගේ ස්වභාවය පංති කාමර ඉගැන්වීම කෙරෙහි බලපාන බවද දක්නට ලැබිණ. එමෙන්ම පංති කාමර ඉගැන්වීමෙහි අපගමනීය තත්ත්ව මග හරවා ගැනීම සඳහා ගුරුවරුන්ගේ පෞද්ගලික සුභසාධනය කෙරෙහි අවධානය යොමු කළ යුතුවා මෙන්ම නැවත නැවත පුහුණු පාඨමාලා වලට ගුරුවරුන් යොමු කරවීම සිදුවිය යුතු බව පෙනී ගිය කරුණකි. එමෙන්ම ගුරු ප්‍රජාව තුළ තම සාර්ථකත්වය ගොඩනැගීම සඳහා නව පාඨමාලා යාවත්කාලීන කළ යුතු අතර ඒවා හඳුන්වාදී ඒ සඳහා යොමුවන වැඩපිළිවෙලක්ද දියත් කළ යුතු බවට යෝජනා කෙරිණි.

# ABSTRACT

The present study is aimed at examining the level of effectiveness of the teaching of Primary School teachers, who have completed the National Diploma in Teaching offered by the National Colleges of Education.

In the past the qualifications accepted for recruitment of teachers were not uniform and people with different qualifications were recruited as teachers. Recently the policy of recruiting people having the National Diploma in Teaching was adopted by the Ministry of Education. Though there was no clean policy regarding the required qualification for recruitment, the educational reforms in the year 1997 adopted the above policy, which was a land mark in teacher recruitment. Accordingly the National Colleges of Education became the major institution in preparing teachers for the primary school. The certificate issued by the NCOE was considered as a prerequisite for the recruitment of primary teachers.

This policy decision was not based on any research evidence. In implementing such a decision, there is a need for assessing the effectiveness of teaching of these teachers holding the NCOE Diploma Certificate in teaching. Therefore if a study could be organized to examine how these teachers holding the teaching Diploma engage in their teaching activities and determine their effectiveness, it would be useful to policy makers in education, the trainers, in the NCOE and also the teachers who are following the course. Also such a study would fulfill a void in the field of research.

A quite big percentage of money allocated for education is spent on the education of these teachers. These teachers undergo two year residential training and one year of internship after, which they get permanent teaching posts in government schools. The assessment of the proficiency of the above said teachers and the effectiveness of their teaching is important.

Therefore in order to achieve this objective the present study was organized to evaluate a sample of teachers who have obtained the Diploma Certificate in Teaching and serving in 1 AB, 1C, 2 and 3 type schools in the Sabargamuwa Province using the Descriptive method of research, Based on this evaluation conclusions about the status of their teaching and suggestions for the improvement of their teaching have been presented.

The present study was based on the following objectives.

1. Examine how the different steps involved in the developmental process of the Teaching Diploma Course have been put into practice.
2. Investigate whether the teaching, after the training is done according to the norms highlighted during the internship period.
3. Find out whether the teaching done after the training comparable to the teaching done during the internship period.
4. Examine the causes for any deviation of the standards of teaching after the training from those of the internship period.
5. Explore the suitable strategies that could be used to correct deviations if any and to improve the course further.

The present study employed the analysis of documents and interviews in the major instruments for the collection of data. Also different techniques for the collection of data were used to collect data related to each objective. In order to collect information about the steps involved in implementing the course, different books written on teacher education, were studied. Also interviews were held with the lecturers in the NCOE ., the officers of the NIE, and the officers of the Teacher Training Branch of the Ministry of Education were interviewed.

For collection of information under the second objective the sources that preserves the norms for teaching during the internship period were studied. Also to collar information about teaching classroom teaching was observed using an observation schedule.

According to the third objective it was examined, whether the class room teaching was one in accordance with the norms adopted during the internship period. This was done comparing the data collected in relation to the third objective with the data collected under the second objective. For the comparison of these two sets of data, the collected data was used with specially constructed inventories.

The fourth objective was aimed at finding whether there are deviations of the actual teaching from the norms adopted for teaching during the internship period. For this purpose the information gathered through the review of literature and the data collected through interviews were used. Based on the analysis using a causal comparative approach the conclusions and the strategies for improvement of the course have been presented.

As the first step in launching the study a sample of teachers comprising about 100-120 was selected representing the 1AB, 1C, 2 and 3 type primary schools in the Sabaragamuwa Province . In selecting the sample attention was drawn to include teachers from all NCOE where Primary Teacher Education Courses are conducted. Also the attention was drawn to represent male and female teachers into the sample without any distinction of their marital status. The class room teaching of these teachers were observed, without any prior notice to them. After the observations were done interviews also were conducted with them. Also the responsible officers in the MOE and the lecturers in the NCOE were consulted about the arrangements made and steps taken for the development of the courses. Further information about this aspect were collected through the review of literature. All these data were analyzed according to the objectives of the study using suitable statistical methods. The findings of the study revealed that the teaching of the teachers who have followed these courses have not met the standards laid down for the internship period. While some teachers had shown

high standards in their teaching. The differences and deviations in teaching were observed in relation to different NCOE where they had received their training.

There were differences in class room teaching depending on their experience in Teaching. Also it was observed that the marital status, the school culture and the individuality of student had caused differences in the standards of teaching. It was found that to reduce the differences in standards of teaching among teachers could be reduced by drawing attention to individual development of teachers and as well by providing opportunities for continuous participation in training programmes. Also there is a need to launch a programme to update the courses to improve the efficiency of teaching.